දැන්වීමයි
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**උරුමය සින්නක්කර ඔප්පු බෙදාදීමේ ජාතික වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත උසස් පෙළ සමත් සැලසුම් ශිල්පය පිළිබඳ හදාරා ඇති සිසුන් තාවකාලික පදනම මත අනුයුක්ත කිරීම**

රජය මගින් ක්‍රියාත්මක උරුමය සින්නක්කර ඔප්පු බෙදාදීමේ ජාතික වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා උසස් පෙළ සමත් කාර්මික විද්‍යාල/ තාක්ෂණික විද්‍යාල සිසුන් 150 දෙනෙකු මාස පහක (05) කාල සීමාවකට ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සුදුසුකම්

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු වේ.
2. අ.පො.ස. උ.පෙළ සමත්ව තිබීම.
3. කාර්මික විද්‍යාලයක/තාක්ෂණික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳව මාස හයක (06) හෝ ඊට වැඩි කාලසීමාවක පාඨමාලාවක් හදාරා තිබිය යුතු වේ.

03. දීමනා

1. එක් දිනක් සඳහා පවරනු ලබන ඉලක්කය සැපිරීම වෙනුවෙන් දිනකට රුපියල් 1500/- ක දීමනාවක් ගෙවීම.

   සහ

2. එක් දිනක් සඳහා පවරනු ලබන ඉලක්කය ඉක්මවා තවත් 25% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කිරීම මත එක් දිනකට උපරිමය රුපියල් 500/- කට යටත්ව දිරි දීමනාවක් ගෙවීම.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

1. මෙම තනතුරු තාවකාලික වේ.
2. තමන් පදිංචි පළාත තුළ ඇති දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල සඳහා මාස 05 ක කාලයකට පමණක් අනුයුක්ත කරනු ලැබේ.
3. සේවා අවශ්‍යතාවය සළකා බලා හැකි සෑම අවස්ථාවකම තමන්ගේ පදිංචි ලිපිනයට ආසන්න කාර්යාලයක් වෙත අනුයුක්ත කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

05. තෝරා ගැනීමේ ක්‍රමය

අංක 02 හි සුදුසුකම් සපුරා ඇති සිසුන් අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේදී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලැබේ.

06. අයදුම්පත්‍ර යොමු කිරීම

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.06.24** දින හෝ ඊට පෙර තමන් පදිංචි පළාත තුළ පිහිටා ඇති **පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල** වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීමට හැකිය. (පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවල ලිපිනයන් අංක 01 වගුවෙහි දක්වා ඇත.

වගුව අංක 01

| අනු අංකය | පළාත | අයත්වන දිස්ත්‍රික්ක | අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය |
|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත | කොළඹ, ගම්පහ, කළුතර | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර),<br>පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය,<br>නාරාහේන්පිට, කොළඹ 05. |
| 02 | මධ්‍යම පළාත | මාතලේ, මහනුවර,<br>නුවරඑළිය | පළාත් සර්වේයර් ජනරාල් (මධ්‍යම),<br>පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය,<br>ගන්නොරුව, පේරාදෙණිය. |
| 03 | සබරගමුව පළාත | රත්නපුර, කෑගල්ල | පළාත් සර්වේයර් ජනරාල් (සබරගමුව),<br>පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, නවනගරය,<br>රත්නපුර. |
| 04 | වයඹ පළාත | කුරුණෑගල, පුත්තලම | පළාත් සර්වේයර් ජනරාල් (වයඹ),<br>පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, කුරුණෑගල. |
| 05 | උතුරුමැද පළාත | අනුරාධපුර,<br>පොළොන්නරුව | පළාත් සර්වේයර් ජනරාල් (උතුරුමැද),<br>පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය,<br>අනුරාධපුරය. |
| 06 | දකුණු පළාත | ගාල්ල, මාතර,<br>හම්බන්තොට | පළාත් සර්වේයර් ජනරාල් (දකුණ), පළාත්<br>සර්වේයර් ජනරාල් කාර්යාලය, ගාල්ල. |
| 07 | උතුරු පළාත | යාපනය,<br>වව්නියාව,කිලිනොච්චිය,<br>මුලතිව්, මන්නාරම | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (උතුර),<br>පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, වව්නියාව. |
| 08 | නැගෙනහිර පළාත | මඩකලපුව, ත්‍රිකුණාමලය,<br>අම්පාර | පළාත් සර්වේයර් ජනරාල් (නැගෙනහිර), පළාත්<br>සර්වේයර් ජනරාල් කාර්යාලය, ත්‍රිකුණාමලය. |
| 09 | ඌව පළාත | බදුල්ල, මොණරාගල | පළාත් සර්වේයර් ජනරාල් (ඌව),<br>පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, බදුල්ල |

**ඩබ්ලිව්.සුදත් එල්.සී.පෙරේරා**
සර්වේයර් ජනරාල්

ඩබ්ලිව්.සුදත් එල්.සී. පෙරේරා
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.

### ආදර්ශ අයදුම්පත්‍රය

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**<u>උරුමය සින්නක්කර ඔප්පු බෙදාදීමේ ජාතික වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත තාවකාලික පදනම මත මාස 5ක කාලසීමාවක් සඳහා අනුයුක්ත කිරීම.</u>**

1.0 සම්පූර්ණ නම:.........................................................................................................................................

..........................................................................................................................................................

2.0 ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය: ☐ (පුරුෂ - M ස්ත්‍රී - F)

4.0 ස්ථිර ලිපිනය :.........................................................................................................................................

..........................................................................................................................................................

5.0 දුරකථන අංක : ස්ථාවර: ..................................................ජංගම: ....................................................

6.0 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:..............................................................

7.0 විද්‍යුත් තැපැල් ලිපිනය:..................................................................................

8.0 අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. විභාගයේ වර්ෂය හා මාසය: ...................

ii. විභාග අංකය: .........................

iii. ප්‍රතිඵලය:

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

9.0 හදාරා ඇති සැලසුම් ශිල්පී පාඨමාලාව පිළිබඳ විස්තර

9.1 හදාරා ඇති පාඨමාලාවේ නම:......................................................................................................

9.2 පාඨමාලාවේ කාලසීමාව:...............................................................................................................

9.3 පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම:.............................................................................................

..........................................................................................................................................................

10.0 අයදුම්කරුගේ සහතිකය :

- මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, ප්‍රකාශ කරමි.

දිනය :...............................         ...........................................................

අයදුම්කරුගේ අත්සන